**පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) හා 108(1) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුයි.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 19 ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ඉදිකර ඇති මාර්ග, මළ අපවාහන, ජලනළ හා සන්නිවේදන පද්ධති හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය ආරම්භයේදී ඉදිකරන ලද මාර්ග, ජලනළ සහ මළ අපවාහන පද්ධති හඳුනාගැනීම අපහසු කාර්යයක් වන අතර දැනට ඉදි කරමින් පවතින ජලනළ සහ මළ අපවාහන පද්ධතීන් හඳුනාගෙන ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පේටන්ට් බලපත්‍ර 02 ක් වාණිජකරණයට ලක්කොට රු.11,050,000 ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබුණු නමුත් එම පේටන්ට් බලපත්‍ර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | විශ්වවිද්‍යාල සතු සියලුම පේටන්ට් බලපත්‍ර ගිණුම්කරණ ප්‍රමිත අංක 20 ප්‍රකාරව 2024 වර්ෂයේ සිට ගිණුම්ගත කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පශු වෛද්‍ය පීඨයේ හා කෘෂි විද්‍යා පීඨයේ ගොවිපලවලින් සමාලෝචිත වර්ෂයට අදාළව ලැබී තිබුණු රු.70,124,305 ක අලෙවි ආදායම් හා රු.100,488,287 ක වියදම් විශ්වවිද්‍යාලයේ ආදායම් හා වියදම් ලෙස මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | එම ව්‍යාපෘති වල ආදායම් හා වියදම් විශ්වවිද්‍යාල ආදායම් හා වියදම් වශයෙන් ගිණුම්ගත කරනු ලබන අතර ඉතිරි ශේෂය අරමුදල් ගිණුමේ පවත්වා ගෙන යනු ලබන බව. | විශ්වවිද්‍යාල ආදායම් හා වියදම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්විය යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබුණු ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 88 කින් විශ්වවිද්‍යාල අරමුදල සඳහා ලැබිය යුතු රු.19,352,214 ක් අදාල අරමුදල් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් අවසන් වීමෙන් පසු විශ්වවිද්‍යාල අරමුදලට අදාල මුදල් මාරුකිරීම පමණක් සිදු කරන බව. | අදාල මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 මැයි 05 දිනැති අංක 09/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව රු.3,695,014ක ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණු අතර ඊට අදාල රු.923,753 ක ක්ෂය හා විදුලි ජනන යන්ත්‍රවලට අදාල රු.2,378,036 ක ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ ප්‍රාග්ධන ස්වරූපයේ ක්‍රීඩා භාණ්ඩ නොවන බැවින් ඒවා පුනරාවර්තන වියදම් ලෙස සලකා ගිණුම්ගත කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | බැඳුම්කරලාභීන් හෝ ඇපකරුවන් සොයා ගත නොහැකි ලෙස හඳුනාගෙන තිබුණු වසර 22 සිට වසර 53ක කාලයක් අයනොවී පවතින අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සේවය කළ නිළධාරීන් 64 දෙනෙකුගෙන් අයවිය යුතු රු.29,523,940 ක බැඳුම්කර වටිනාකම වෙනුවෙන් අඩමාණ ණය සඳහා වෙන් කිරීමකින් තොරව තවදුරටත් ජංගම වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ඇපකරුවන්ගෙන් හෝ අර්ථසාධක අරමුදලින් හෝ අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කරන බැවින් ඉතා කෙටි කාලයක් තුළ අයකර ගැනීමේ අරමුණින් ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර ඇති බව. | ලැබිය යුතු ශේෂයන්හි අවිනිශ්චිත ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ඒ සඳහා අඩමාන ණය වෙන් කිරීමක් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළව විදේශීය සිසුන් 16 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.48,027,480 ක පාඨමාලා ගාස්තු ආදායම ගිණුම් ගත කර නොතිබූ අතර දන්ත වෛද්‍ය පීඨයේ විදේශ ශිෂ්‍යයින්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.1,289,205ක් ආදායම් ලෙස හඳුනා ගැනීමකින් තොරව අරමුදල් ගිණුමකට බැර කර තිබුණි. | විදේශීය සිසුන් 16 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.48,027,480 ක වටිනාකම ඉදිරියේදී ගිණුම්ගත කරන බවත් රු.1,289,205 ක මුදල විදේශීය පශ්චාත් උපාධි හදාරන දන්ත වෛද්‍ය සිසුන්ගෙන් ලද කෙටිකාලීන පාඨමාලා ගාස්තුවක් බව . | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | බදු පදනම මත දිවිනැඟුම දෙපාර්තමේන්තුව වෙත 1987 වර්ෂයේ පවරාදී තිබුණු විශ්වවිද්‍යාලයට අයත් ගැටඹේ ප්‍රදේශයේ පිහිටි පර්චස් 40 ක ඉඩමෙන් 1988 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාළව ලැබිය යුතු රු.11,550,000 ක බදු ආදායම ගිණුම්ගත කර නොතිබුණි | 2018-2023 දක්වා කාලයට අදාලව විධිමත් ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් එම කාලපරිච්ඡේදයට අදාලව බදු ආදායම ගිණුම්ගත කිරීමට නොහැකි බව. | සියලු ආදායම් ගිණුම්ගත කළ යුතු අතර හිඟව පවතින බදු මුදල් කඩිනමින් අය කර ගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.5,975,650ක වෛද්‍ය රසායනාගාර ආදායම විශ්වවිද්‍යාලයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විශ්වවිද්‍යාල ආදායම ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | අනේවාසික විදේශ මුදල් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු. 4,104,684ක විදේශ මුදල් හුවමාරු අලාභය, රු.4,635,443 ක විදේශ මුදල් හුවමාරු | මෙම දෝෂය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විදේශ මුදල් හුවමාරුව මත ඇතිවන ලාභය හෝ අලාභය නිවැරදිව |

| | | | |
|---|---|---|---|
| | ලාභයක් ලෙසට ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා මුදල් හා මුදල් සමානදෑ රු.8,740,127 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. | | හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැළපිය යුතුය. |
| (එ) | බැඳුම්කර කඩ කරන ලද නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.17,406,675 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ලැබිය යුතු ආදායමක් වශයෙන් දක්වා තිබියදී මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා හෙළිදරව් කිරීම් යටතේ එම වටිනාකම අසම්භාව්‍ය වත්කම් ලෙස හෙළිදරව් කර තිබුණි. | අවිනිශ්චිතතාවක් පවතින ශේෂයන් පිළිබඳ ගිණුම්කරණ ඇමුණුමක් මේ සඳහා ලබා දී ඇති අතර මෙම ලැබිය යුතු ශේෂයන් අසම්භාවය වත්කම් ලෙසට ගිණුම්ගතකර නොමැති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අවිනිශ්චිතතාවය ක් පවතින ශේෂයන් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීමක් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට සිසුන්ගෙන් අයවිය යුතු රු.1,175,380 ක ශේෂයෙන් රු.594,953 ක හිඟ දඩ මුදල් හා නේවාසිකාගාර ගාස්තු වසර 02 සිට වසර 05 දක්වා කාලයක් ද, රු.580,427 ක ශේෂයක් වර්ෂ 05 කට වැඩි කාලයක්ද ගතවී ඇතත්, අයකර නොතිබුණි. | වසර 02 - 05 ත් අතර කාලයේ වූ රු.594,953 ක දඩ මුදල් අයකර ගනිමින් පවතින අතර වර්ෂ 05 කට වැඩි රු.580,427 ක ශේෂයට අදාල ශිෂ්‍යයන්ගේ ලියාපදිංචිය මේ දක්වා අවලංගු කර නොමැති බැවින් පොත් වලින් ලියා හැරීමට හැකියාවක් නොමැති බව. | සියලු ගාස්තු කඩිනමින් අය කළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,362,330 ක ණය ශේෂ අයවීම නතර වී වසර 01 සිට වසර 10 දක්වා කාලයක් ගත වී ඇතත්, අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල නිලධාරින්ගේ අර්ථ සාධක අරමුදල් නිදහස් කිරීමේදී මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | සියලු අත්තිකාරම් ණය ශේෂ අයකර ගත යුතුය. |

## 1.7 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු පනත් | | | |
| i. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ විද්‍යා පීඨයේ දේශකවරුන් 92 දෙනෙකු සඳහා රු.327,471,914 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණද ඔවුන් ඉටු කළ රාජකාරී තහවුරු කිරීමට අවශ්‍ය තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී නිවැරදි පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | ඉටු කළ රාජකාරි තහවුරු කිරීමට අවශ්‍යය සියලු තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| ii. | 1840 අංක 07 දරන වංචා වැළැක්වීමේ ආඥා පනතේ 04 වන වගන්තිය | මියගිය මහාචාර්යවරියකගේ නාමිකයා නම් කරන ලද ප්‍රකාශයේ සාක්ෂිකරුවන් දෙදෙනෙකු අත්සන් නොකිරීම සහ මහාචාර්යවරියගේ අත්සන ව්‍යාජ අත්සනක් බව නිරීක්ෂණය වී තිබියදී, ඇයට හිමි රු.3,273,535 ක සේවක අර්ථසාධක ප්‍රතිලාභයද ඇයගේ ස්වාමිපුරුෂයා වෙත ගෙවා තිබුණි. | මේ සම්බන්ධව පත් කරන ලද විමර්ශන කමිටු වාර්තාව අනුව හා මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තීන්දුව ප්‍රකාරව ඉදිරි කටයුතු කරනු ලබන බව. | ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |
| iii | 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතේ 09 වන වගන්තිය | මියගිය මහාචාර්යවරියකට හිමිව තිබුණු රු.2,579,064 ක් වූ සේවක පාරිතෝෂිත ප්‍රතිලාභය අනිකුත් උරුමක්කරුවන් පිළිබඳ නොසළකා ඇයගේ ස්වාමි පුරුෂයා වෙත පමණක් ගෙවා තිබුණි. | මේ සම්බන්ධව පත් කරන ලද විමර්ශන කමිටු වාර්තාව අනුව හා මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තීන්දුව ප්‍රකාරව ඉදිරි කටයුතු කරනු ලබන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| iv. | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | අදාල අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව රු.449,981,632 ක අතිරික්ත මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ආයෝජනය කර තිබුණි. | ස්ථාවර තැන්පතු ආයෝජනය සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන මහා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති බව. | මුදල් පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

(ආ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය
-----------------------------------

| | | | |
|---|---|---|---|
| I කොටසේ VI පරිච්ඡේදයේ 11.1 ඡේදය | මිය ගිය සේවකයෙකුගේ මිය ගිය මාසයට අදාළ වැටුප පමණක් ළඟම ඥාතියෙකුට ගෙවිය හැකි වුවද, මිය ගිය මහාචාර්යවරියට මිය ගිය මස වැටුපට අමතරව රු.862,131ක හිඟ වැටුප් හා දීමනා ඇයගේ ස්වාමිපුරුෂයා වෙත මුදලින් ගෙවා තිබුණි. | අතිරික්තව ගෙවා ඇති වැටුප් හා දීමනා විශ්‍රාම වැටුප් අරමුදලින් පියවා ගැනීමට කටයුතු කරන බව. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

(ඇ) චක්‍රලේඛ
-----------

| | | | |
|---|---|---|---|
| i. 2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ රු.49,827,000 ක මුදලක් සේවක අග්‍රහාර රක්ෂණ දායකය වශයෙන් ජාතික රක්ෂණ භාරකාර අරමුදල වෙත විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි. | 2018 නොවැම්බර් 26 දිනැති 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුගතව හා වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත්කර ගෙවීම් සිදු කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. |
| ii . 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ චක්‍රලේඛය<br>---------------- | | | |
| a. 5.1.2 ඡේදය | 2020 ජනවාරි 01 දින සිට 2023 ජූලි 31 දින දක්වා කාලය තුළ ක්‍රියාත්මකව පැවතුණු එකතුව රු.297,501,367 ක ආදායමක් සහිත ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 98 කින් දේශන ශාලා, රසායනාගාර හා අනිකුත් පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය වෙත කිසිදු දායකත්වයක් ගෙවා නොතිබුණි. | අයවැය ලේඛන වල මේ සඳහා වෙන්කිරීමක් කර නොමැති වුවද 5.1.4 හා 5.2.1 යන සංවර්ධන වැය විෂයන් යටතේ ඒ සඳහා වෙන් කිරීම් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් වලට අනුව කටයුතු කළ යුතුය. |
| b. 5.2.1 හා 5.2.2 ඡේද | 2017 ජනවාරි 01 දින සිට 2023 ජූලි 31 දින දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලද තත්‍ය ආදායම රු.9,948,695 ක් වූ ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 10 කට අදාළ කිසිදු දායකත්වයක් විශ්වවිද්‍යාල | මෙම ව්‍යාපෘති මඟින් විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට සෘජුව දායකත්වයක් ලබාදී නොමැති වුවද කාර්යය මණ්ඩල පුහුණුව වැනි වෙනත් දායකත්වයන් | චක්‍රලේඛ උපදෙස් වලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සංවර්ධන වැය විෂයයන් සඳහා වෙන් කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය වෙත ලබා දීමට කටයුතු කර ඇති බව. | |
| iii. | 1989 ඔක්තෝබර් 20 දිනැති අංක 408 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 05 (d) ඡේදය | වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු ලබා පසුව වැටුප් රහිත සප්ත වාර්ෂික නිවාඩු ලබා ගත් නිලධාරීන් 03 දෙනෙකුට ගෙවා තිබුණු රු.9,081,981 ක වැටුප් හා දීමනා සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වාම අය කර නොතිබුණි. | මෙම නිලධාරීන් හට වැඩිපුර ගෙවන ලද වැටුප් හා දීමනා සේවක අර්ථසාධක අරමුදලින් හා පාරිතෝෂික අරමුදලින් අය කර ගැනීමට මේ වන විටත් කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ උපදෙස් වලට අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.342,546,289 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.77,582,289 ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.264,964,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පෞද්ගලික පඩිනඩි වියදම්, නඩත්තු වියදම් , ගිවිසුම් සේවා වියදම් හා අධ්‍යයන කටයුතු සඳහා මූල්‍ය සහයක වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සේවය කළ මහාචාර්යවරයෙක් අධ්‍යයන හා සප්ත වාර්ෂික නිවාඩු ලබාගත් 2019 දෙසැම්බර් 30 දින සිට 2023 අප්‍රේල් 30 දින දක්වා කාලය තුළ රාජ්‍ය ආයතන 03 කින් එකතුව රු.24,129,082 ක වැටුප්, දීමනා හා වැඩ බැලීමේ වැටුප් ලබාගෙන තිබුණි. එම කාල සීමාව තුළ අධ්‍යයන, පර්යේෂණ හා ජීවන වියදම් දීමනාව වශයෙන් රු.9,639,043 ක් ආයතන දෙකකින් ලබාගෙන තිබුණි. එලෙස අධ්‍යයන නිවාඩු කාලය තුළ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයෙන් ගෙවූ රු.6,110,066ක වැටුප් හා දීමනා 2024 මාර්තු වන විටත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි සාක්ෂි හා ඇමුණුම් සහිත පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | දෙවරක් ගෙවා ඇති දීමනා අයකර ගත යුතු අතර මේ දක්වා ප්‍රතිපූර්ණය නොකළ මුදල කඩිනමින් ප්‍රතිපූර්ණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | AHEAD ව්‍යාපෘතිය යටතේ 2018 සිට 2023 කාලපරිච්ඡේදය තුළදී ශිෂ්‍යත්ව ප්‍රදානයන් ලබාගත් කථිකාචාර්යවරු 04 දෙනෙකු ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයවිය යුතු රු.61,569,383 ක් අය කරගෙන නොතිබුණි. | අයකර ගත යුතු ප්‍රමාණය අර්ථසාධක අරමුදලින් හා පාරිතෝෂික අරමුදලින් අයකර ගැනීමට කටයුතු කරන බව. | අදාල මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2017 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් දක්වා කාලයට අදාළ රු.3,455,500 ක පර්යේෂණ 06 ක් නියමිත පරිදි සම්පූර්ණ නොකිරීම හේතුවෙන් අවලංගුකර තිබුණු අතර එම පර්යේෂණ ප්‍රදාන වෙනත් පර්යේෂණ සඳහා උපයෝජනය කිරීමට තිබුණු අවස්ථා අහිමි වී ගොස් තිබුණි. | මෙම පර්යේෂණ ප්‍රදානයන් සියල්ල අවලංගුකර ඇති අතර අදාල අයකර ගැනීම් සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | අදාල අයකර ගැනීම් සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන කටයුතු සඳහා බඳවාගත් තාවකාලික දේශකවරුන් දෙදෙනෙකු අධ්‍යයන කටයුතුවලට යොදවා ගැනීමකින් තොරව පීඨාධිපති කාර්යාලයේ විවිධ ව්‍යාපෘතිවල මෙහෙයුම් කටයුතු සඳහා යොදවාගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.1,913,090 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | ඉදිරියේදී නිවැරදි සාක්ෂි ඇමුණුම් සහිත පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | බඳවාගත් තාවකාලික දේශකවරුන් අධ්‍යයන කටයුතුවලට යොදවා ගත යුතුය. |
| (ඉ) | 2019 වර්ෂයේ අප්‍රේල් සිට 2022 වර්ෂයේ පෙබරවාරි දක්වා කාලය තුළ වැඩ තහනම් කරනු ලැබූ වැඩ ඉංජිනේරුවරයාගේ චෝදනා තහවුරු කර ගැනීමට නොහැකි වීමෙන් නැවත සේවයේ පිහිටුවා තිබුණි. විශ්වවිද්‍යාලය වෙත කිසිදු සක්‍රීය සේවාවක් ලබාදී නොතිබියදී එකී කාලපරිච්ඡේදය සඳහා හිඟ වැටුප් හා දීමනා ලෙස රු.4,623,485 ක මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. | විධිමත් විනය පරීක්ෂණයක් මඟින් කිසිදු මූල්‍ය වංචාවක් සිදු කළ බවට අනාවරණය නොවීම හේතුවෙන් වැටුප් රහිත කාලයට අදාලව වැටුප් ගෙවීමට විශ්වවිද්‍යාල පාලක සභාව තීරණය කර හිඟ වැටුප් හා දීමනා ගෙවා ඇති බව. | නිලධාරියෙකුගේ වැඩ තහනම් කිරීමට පෙර විචක්ෂණශීලීව හා සැලකිල්ලෙන් යුතුව කටයුතු කළ යුතු අතර ගෙවන ලද වැටුප් හා දීමනා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගත යුතුය. |
| (ඊ) | ඉල්ලා අස්වෙන දිනට මාස 03 ක කාලයකට පෙර දැනුම්දීමකින් තොරව 2020 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ ඉල්ලා අස්වී තිබුණු ආචාර්යවරුන් 59 දෙනෙකුගෙන් අයකළ යුතු එකතුව රු.12,232,161 ක් වූ මාස 03 ක වැටුප අයකර ගැනීමකින් තොරව ඉල්ලා අස්වීම සඳහා අවස්ථාව ලබා දී තිබුණි. | ඉදිරියේදී නිවැරදි සාක්ෂි ඇමුණුම් සහිත පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | අයකළ යුතු වැටුප් හා දීමනා කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | විද්‍යා පීඨයට අයත් දෙපාර්තමේන්තු 09 ක අධ්‍යයන පාඨමාලා 04 ක් වෙනුවෙන් බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව බඳවා ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව සමඟ සැසඳීමේදී සියයට 01 සිට සියයට 16 දක්වා වූ ප්‍රතිශතයකින් අඩුවී තිබීම හේතුවෙන් පසුගිය අධ්‍යයන වර්ෂ 03 තුළ විද්‍යා විෂයන් හදාරන උපාධිධාරීන් 152 දෙනෙකුට විශ්වවිද්‍යාල වරම් අහිමිවී තිබුණි. | ඉදිරියේදී නිවැරදි සාක්ෂි ඇමුණුම් සහිත පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව උපරිම ධාරිතාවයෙන් යුක්තව බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පර්යේෂණ අරමුදල් 05කට හා වෙනත් අරමුදල් 02කට අදාළ පිළිවෙලින් රු.1,932,972ක් හා රු.1,951,178 ක් වසරකට වැඩි කාලයක් ද, අරමුදල් 14කට අදාළ රු.15,270,168 ක් වසරක කාලයක් ද ඌන උපයෝජිතව තිබුණි. | සමාලෝචිත වර්ෂයේදී මෙම අරමුදල් යටතේ ගෙවීම් සඳහා ඉල්ලුම් කිරීම් කිසිවක් සිදුවී නොමැති බව. | අරමුදල් අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශාස්ත්‍ර පීඨය සඳහා රු.35,526,904 ක් වැය කර 2021 ජූලි12 දින වන විට සවිකර තිබුණු විදුලි සෝපාන 04 න් විදුලි සෝපාන යන්ත්‍ර 03 ක් වසර 02 කට වැඩි කාලයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම විදුලි සෝපාන විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ස්ථාපිත කර ඇති බව හා සාමාන්‍ය සිසුන් හා කාර්යමණ්ඩලය විසින් භාවිතා නොකරන බැවින් නිෂ්කාර්යය වියදමක් නොවන බව. | තාක්ෂණික දුර්වලතා නිවැරදි කර උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ආ) | AHEAD ව්‍යාපෘතිය යටතේ රු.12,577,600 ක නියමිත ප්‍රමිතියෙන් තොර ලැප්ටොප් පරිගණක 80 ක් ශාස්ත්‍ර පීඨය සඳහා මිලදී ගෙන තිබුණු අතර එම පරිගණක යන්ත්‍රවලින් 35 ක් මාස 05 සිට මාස 09 ක් දක්වා කාලයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම පරිගණක සඳහා ලබා දී ඇති වගකීම් කාලය තුල එම සමාගම හරහා පිළිසකර කරගැනීමට කටයුතු කරන බව හා අදාළ සමාගම සමඟ ඉදිරියේදී ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට කටයුතු කරන බව. | නියමිත ප්‍රමිතියෙන් යුතු පරිගණක මිලදී ගත යුතු අතර ඒවා නිසි පරිදි උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම හා සමානාත්මතාවය ආරක්ෂා කිරීමේ අරමුණින් මිලදී ගෙන තිබුණු රු.1,748,500 ක් වටිනා ටැබ් (Tab) යන්ත්‍ර 18 ක් හා පරිගණක යන්ත්‍ර 03 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 02 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | Tab යන්ත්‍ර 18 ක් තබා ඇත්තේ නව අධ්‍යයන වාරයේ පැමිණෙන සිසුන් සඳහා වන බව හා පරිගණක යන්ත්‍ර 03 න් එකක් පීඨාධිපති කාර්යාලයට හා 02 ක් ලලිත කලා අධ්‍යයන අංශයට නිකුත් කර ඇති බව. | පරිගණක උපාංග උපරිම ඵලදායිතාවයෙන් යුක්තව මිලදී ගත් අරමුණ සඳහා උපයෝජනය කළ යුතුය. |

**3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට 2023 ඔක්තෝම්බර් දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර අවසන් කළ යුතු රු.17,261,711ක පර්යේෂණ ව්‍යාපෘති 31ක පර්යේෂණ කටයුතු අවසන් කිරීමට හෝ පර්යේෂණ ව්‍යාපෘතිවල කාල සීමාව දීර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් රු.1,535,000 ක මුදලක් ඒ සඳහා වියදම් කර තිබුණි. | අවලංගු කරන ලද පර්යේෂණ ප්‍රදානයන් අදාල පර්යේෂණ ලාභීන්ගෙන් අයකර ගැනීමටත් අනෙකුත් ව්‍යාපෘතිවල කාල සීමාව දීර්ඝ කිරීමටත් කටයුතු කර ඇති බව. | අවලංගු කරන ලද ප්‍රදානයන්අදාල ප්‍රදානලාභීන්ගෙන් අයකර ගත යුතු අතර අනෙකුත් පර්යේෂණ කටයුතු නියමිත කාල සීමාව තුල අවසන් කළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශාස්ත්‍ර පීඨ සත් මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු රු.439,602,148 ක් වැය කර වැඩ නිමවී මාස 17කට අධික කාලයක් ගතවී තිබුණද ගොඩනැගිල්ලට ස්ථිර විදුලි සැපයුමක් ලබා ගැනීමට නොහැකිවීම හේතුවෙන් ගොඩනැගිල්ල උපරිම ධාරිතාවයෙන් යුතුව භාවිත කිරීමට නොහැකි වී තිබුණි. | මෙම ගොඩනැගිල්ලට ට්‍රාන්ස්පෝමරයක් මගින් අභ්‍යන්තර විදුලි සැපයුම් ජාලය හරහා විදුලි සැපයුම ලබා දීමට ලංකා විදුලිබල මණ්ඩලය සමඟ අවැසි කටයුතු ක්‍රියාත්මකව පවතින බව. | ස්ථිර විදුලි සැපයුමක් ලබාගෙන ගොඩනැගිල්ල උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සම සෞඛ්‍ය විද්‍යා පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේ උපදේශන කාර්යය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානය (EDC) වෙත භාරදීමට කටයුතු නොකර බාහිර ආයතනයක් වෙත ලබාදී රු.2,876,116ක ගාස්තුවක් ගෙවා තිබුණි. | එය විශ්වවිද්‍යාල ආයතනයක් බැවින් ගෙවීම් කළ නොහැක. එබැවින් ඉංජිනේරු උපදේශන සේවාවන් අනෙකුත් රජයේ ආයතන වෙතින් ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | රජයට උපරිම ආර්ථික වාසි අත්වන අයුරින් කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 ජූලි 11 වන දින රු.714,535,924කට ජල සැපයුම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 ජූලි 10 දින වන විට අවසන් කිරීමේ පදනමට ජාතික | ඉදිරියේදී නිවැරදි පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | රජයට උපරිම ආර්ථික වාසි අත්වන අයුරින් ගිවිසුම් ගත |

| | | | |
|---|---|---|---|
| | ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ගිවිසුම් ගතව පවරා දී 2021 දෙසැම්බර් 31 දින වන විට රු.420,895,652ක් ගෙවා තිබූ අතර එදිනට භෞතික ප්‍රගතිය සියයට 52 ක් පමණක් තිබියදී ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි. ගිවිසුම් ගත කාල සීමාව තුළ කර්මාන්තය නිම නොකර නැවත ඉතිරි කටයුතු නිම කිරීමට මුල් ඇස්තමේන්තුව ඉක්මවා රු.මිලියන 785ක අතිරේක ඇස්තමේන්තුවක් 2023 ජූලි 20 දින මණ්ඩලය විසින් නැවත ලබා දී ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භකර තිබුණි. | | කාල සීමාව තුළ කොන්ත්‍රාත් වැඩ නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ සෘජු ශ්‍රම පදනම මත ඉටු කර තිබුණු එකතුව රු.85,928,622 ක නඩත්තු වැඩ 3621ක් පිළිබඳ විස්තරාත්මක ඇස්තමේන්තු ද්‍රව්‍ය, ශ්‍රම වාර්තා සහ ඉටු කළ වැඩ වාර්තා සකස් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | නඩත්තු වැඩ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල හැකි වන පරිදි අදාල ලේඛන හා වාර්තා පවත්වාගෙන යා යුතුය. |
| (ඉ) | 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පුනරුත්ථාපන හා ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් වැය කර තිබුණු එකතුව රු.308,330,445 කට අදාළ ව්‍යාපෘති වැඩ අවසන් නොකර අතහැර දමා තිබුණද ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම මුදල් අය කිරීමට හෝ පොත්වලින් ලියා හැරීමට හෝ කටයුතු නොකර අඛණ්ඩව නොනිමි වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | අත්හැර දමන ලද ව්‍යාපෘති වලට අදාලව වැය කළ මුදල් ආපසු අය කර ගැනීමට හෝ පොත් වලින් කපා හැරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ඊ) | විශ්වවිද්‍යාලයේ ජල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 04 හි මුළු ඉංජිනේරු ඇස්තමේන්තුව රු.100,136,000ක් වූ නමුත් රු.55,982,587 ක අවම මිල ගණනක් ඉදිරිපත් කළ ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ඉංජිනේරු ඇස්තමේන්තු මිලට වඩා ලංසු මිල සියයට 42 සිට 52 දක්වා විචලනයක්ද ප්‍රමාණ පත්‍රවල ප්‍රධාන වැඩ විෂයයන්හි සියයට 23 සිට සියයට 97 දක්වා විචලනයක්ද තිබියදීත් නියමිත පිරිවිතරයන්ට හා ගුණත්වයෙන් යුතුව කර්මාන්තය නිම කළ හැකිද යන්න සලකා බැලීමකින් තොරව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | ඉදිරියේදී නිවැරදි පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | කොන්ත්‍රාත් පිරිනැමීමට අදාල ප්‍රසම්පාදන කටයුතු විනිවිද භාවයකින් හා අදාළ නියමයන්ට අනුව සිදු කළ යුතුය. |